කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි /අගෝස්තු

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල**

**පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය- SINH 18224**

පළමුවන කොටසත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

**<u>I කොටස</u>**

01. අ) පහත සඳහන් උද්ධෘතයේ අර්ථය ලිහිල් බසින් ලියා, එහි අවස්ථා සම්බන්ධය පැහැදිලි කරන්න.

> "ජාම්බෝනද ස්වර්ණයට බඳු ව දිවි දළින් ඔප් නැඟූ රන් රුවනට බඳු උතුම් රූ දරන්නා වූ කාන්තාව, මේ ලෝකයෙහි සත්ත්වයන්ට ප්‍රියකරු වූ යම් වස්තුවක් ඇත්නම් ඒ සියල්ල ම මාගේ බොහෝ කොට ඇත්තේය. මා හා සමග මගේ භවනයට අවුත් ලෝකාස්වාදරතියෙන් යෙදී වාසය කරව. ඉදින් මා කීවාට නොමැලිව නොආයේහි වී නම් දැන් ම බලාත්කාරයෙන් මාගේ විමානයට ගෙන ගොසින් තී හා සමග වාසය කෙරෙමි. එසේ ගෙන ගිය කල්හිත් මා සිත් ගෙන වාසය නොකෙළෙහි නම් එවිට ම තී මට ගොදුරු වන්නේ ය" යි කීයේ ය. මෙසේ කියා ජව සතකින් යුක්ත රූක්‍ෂ ප්‍රකෘති ඇති පිටකට නික්මුණු මහත් දළ ඇති පාත්‍රවට සේ මහත් ව රත් ව පිටතට නෙරීසිටියා ඇස් ඇති දානව රාක්‍ෂස තෙම ඒ වන මධ්‍යයෙහි කිසි පිහිටක් නැති ව අසරණ ව සිටි ඒ රජ දුව අත අල්වා ගත්තේය. ක්ලේශගත ව තමා අත ගත් රාක්‍ෂසයා විසින් පෙළන ලද සතුරා වසඟයට පැමිණි බිසව් තමාගේ වල්ලභයා ම සිතා සෝකයෙන් හඬන්නී මෙසේ කියා, "යම් බඳු ව මේ රාක්‍ෂසයා මා අල්වා ගෙන අත්පා උණ කිලිල්ලක් සේ කඩා කන්නේ වී නමුත් ඒ මට දුක් නොවෙයි.

ලකුණු 12 (8+4)

ආ) පහත සඳහන් පද්‍යයන්ගේ අර්ථය ලිහිල් බසින් ලියා, කවියාගේ වර්ණනා චාතුර්යය කෙටියෙන් පැහැදිලි කරන්න.

| | | |
|---|---|---|
| නු ව නි න් | නිල් උපුල් මදහසිනි හෙළැඹූ | ල |
| වූ ව නි න් | කමල් පෑ ලවනතිනි රතු පු | ල |
| ප ව නි න් | අඹල රනලිය වන් ලියන් කැ | ල |
| රූ ව නි න් | ලකළ ගඟදිය කෙළෑ නිමුණු ක | ල |
| | | |
| ව දි මි න් | සවස නල හැසිරෙන දිගතුව | ල |
| සොබම න් | සුනිල් මිණිනිල් නුබතුරැ විපු | ල |
| ප ත ස න් | අවරගිරි නැටියෙන් වැටෙන ක | ල |
| වි ලි කු න් | සුරත් පල වැනි වේ රිවිමඬ | ල |
| | | |
| ම හ තු න් | හසළ තමහට යස පිහිට ලෙ | ස |
| නිය ති න් | නොහළ යුතු බව පැමිණෙන වෙහෙ | ස |
| සු ද න න් | පැවැති සිරිතැයි දන්වන විල | ස |
| නු බ මි න් | සමඟ ගෙවෙනුය දහවල් දව | ස |
| | | |
| සැ දෑ | ළෙන් වරුණ දෙව්රද මුහුද වි | සූ |
| සැ දෑ | සහස කර එන මහවත සැල | සූ |
| වි දෑ | උපුල් පිළ මෙන් රත් පටින් වැ | සූ |
| සැ ඳෑ | වලාපෙළ පැළඳිග පෙනුණු ප | සූ |

ලකුණු 12 (8+4)

## II කොටස

02. මනුෂ්‍ය සන්තානගත ගූඪ චෛතසික නිරූපණයෙහි ලා ජාතකකථාකරු දැක්වූ සාමර්ථ්‍යය නිදසුන් ඇසුරින් පරීක්ෂා කරන්න.

03. සැළලිහිණි සන්දේශයෙන් හෙළිවන සිරි රහල් හිමියන්ගේ ප්‍රතිභාන්විත කවිත්වය පිළිබඳ සනිදර්ශන විමසීමක් කරන්න.

04. කුරුණෑගල යුගයේ රචිත සාහිත්‍ය කෘතිවලින් පිළිබිඹු වන විශේෂතා කවරේදැයි සාකච්ඡා කරන්න.

නැතහොත්

ගම්පොළ යුගය සිංහල සාහිත්‍ය යුග අතර විශේෂ සන්ධිස්ථානයක් වන්නේ කවර හේතු සාධක නිසාදැයි විභාග කරන්න.

05. කෝට්ටේ යුගයේ දී විවිධ විෂයක පද්‍යාකෘති හා තේමා සහිත නිර්මාණ බිහිවීම කෙරෙහි උපස්තම්භක වූ සමාජ-ආර්ථික හා දේශපාලන පසුබිම පිළිබඳ විග්‍රහයක් කරන්න.

## III කොටස

06. ප්‍රාමාණික නිර්වචනාශ්‍රයෙන් 'භාෂාව' යන්න විග්‍රහ කරන්න.

නැතහොත්

භාෂාවක ශබ්ද නිෂ්පාදන ක්‍රියාවලිය, වාග්විද්‍යානුකූලව පැහැදිලි කොට නිදසුන් දෙමින් විභාග කරන්න.

07. සිංහල භාෂාද්විරූපතාව (Sinhalese Diglossia) තීව්‍ර වීමෙහි ලා බල පෑ ඓතිහාසික සාධක පරීක්ෂා කරන්න.

08. 'උපභාෂා' යන්න හඳුන්වා එවැනි භාෂාස්වරූප නිර්මාණය වීමෙහි ලා බලපාන විවිධ සාධක පරීක්ෂා කරන්න.

09. භාෂාව සංස්කෘතියේ නිදර්ශනයයි. සාකච්ඡා කරන්න.

**නැතහොත්**

සමාජයේ විවිධතා භාෂාවෙන් නිරූපණය වන ආකාරය නිදර්ශනාශ්‍රයෙන් පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ප්‍රමාණවත් සටහන් ලියන්න.

i. භාෂණ සිංහලයේ අස්පර්ශ ශබ්ද
ii. සිංහල භාෂාවේ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය
iii. සිංහලයේ ප්‍රාස්තාවික භාෂා ස්වරූප (Registers)
iv. සිංහල භාෂාවේ පරිමිත ව්‍යවහාර (Restricted Language)

(02 - 10 පිළිතුරුවලට ලකුණු 19 බැගින්)

***********************************